# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2243/16 - 2021 සැප්තැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ චාවකච්චේරිය නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන චාවකච්චේරිය නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ(1)(අ) වගන්තිය යටතේ චාවකච්චේරිය නගර සභාවේ අංක 07 - චාවකච්චේරිය නගරය කොට්ඨාසයට තේරී පත්වූ පරමේශ්වරන් ජයකාන්දන් අයත්වන්නා වූ අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වන වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම චාවකච්චේරිය නගර සභාවේ අංක 07 - චාවකච්චේරිය නගරය කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා වීරසිංසම් විජජේන්තිරන් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

චාවකච්චේරිය නගර සභාවේ තේරීම්භාර නිලධාරී, රාජේන්ද්‍රම් ක්‍රිස්ටි අමල්රාජ් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් වීරසිංසම් විජජේන්තිරන්, චාවකච්චේරිය නගර සභාවේ අංක 07 - චාවකච්චේරිය නගරය කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. සී. අමල්රාජ්,
තේරීම්භාර නිලධාරී,
චාවකච්චේරිය නගර සභාව.

2021 අගෝස්තු මස 20 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
යාපනය.


1A - G 34542 — 30 (2021/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*